ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුව
இலங்கைப் பரீட்சைத் திணைக்களம்

රහස්‍යයි

අ.පො.ස. (සා.පෙළ) විභාගය - 2025(2026)
க.பொ.த. (சா.தர)ப் பரீட்சை - 2025(2026)

විෂය අංකය / பாட இலக்கம்: **21** | විෂයය / பாடம்: **සිංහල භාෂාව හා සාහිත්‍යය I**

## I පත්‍රය - පිළිතුරු
## I பத்திரம் - விடைகள்

| ප්‍රශ්න අංකය வினா இல. | පිළිතුරෙහි අංකය விடை இல. | ප්‍රශ්න අංකය வினா இல. | පිළිතුරෙහි අංකය விடை இல. | ප්‍රශ්න අංකය வினா இல. | පිළිතුරෙහි අංකය விடை இல. | ප්‍රශ්න අංකය வினா இல. | පිළිතුරෙහි අංකය விடை இல. |
|---|---|---|---|---|---|---|---|
| 01. | 4 | 11. | 3 | 21. | 2 | 31. | 3 |
| 02. | 1 | 12. | 4 | 22. | 1 | 32. | 4 |
| 03. | 3 | 13. | 1 | 23. | 1 | 33. | 1 |
| 04. | 2 | 14. | 3 | 24. | 1 | 34. | 3 |
| 05. | 1 | 15. | 2 | 25. | 4 | 35. | 1 |
| 06. | 4 | 16. | 4 | 26. | 3 | 36. | 2 |
| 07. | 2 | 17. | 3 | 27. | 1 | 37. | 4 |
| 08. | 4 | 18. | 4 | 28. | 3 | 38. | 2 |
| 09. | 1 | 19. | 3 | 29. | 3 | 39. | 3 |
| 10. | 3 | 20. | 1 | 30. | 1 | 40. | 2 |

විශේෂ උපදෙස් / விசேட அறிவுறுத்தல் } එක් පිළිතුරකට ලකුණු / ஒரு சரியான விடைக்கு **01** බැගින් / புள்ளி வீதம்

මුළු ලකුණු / மொத்தப் புள்ளிகள் **01 × 40 = 40**

පහත නිදසුනෙහි දැක්වෙන පරිදි බහුවරණ උත්තරපත්‍රයේ අවසාන තීරුවේ ලකුණු ඇතුළත් කරන්න.
கீழ் குறிப்பிடப்பட்டிருக்கும் உதாரணத்திற்கு அமைய பல்தேர்வு வினாக்களுக்குரிய புள்ளிகளை பல்தேர்வு வினாப்பத்திரத்தின் இறுதியில் பதிக.

නිවැරදි පිළිතුරු සංඛ්‍යාව / சரியான விடைகளின் தொகை: $\frac{25}{40}$

I පත්‍රයේ මුළු ලකුණු / பத்திரம் I இன் மொத்தப்புள்ளி: $\frac{25}{40}$



CamScanner

# 21 - සිංහල භාෂාව හා සාහිත්‍යය
# II පත්‍රය

**ප්‍රශ්න අංකය 01**

**අපේක්ෂණය** - **භාෂා පරිචය ඇගයීම**

මෙම ප්‍රශ්නයට කෙටි උත්තර අපේක්ෂිත අනු ප්‍රශ්න දහයක් ඇතුළත් වේ. අනු ප්‍රශ්නයකට ලකුණු 02 බැගින් ලකුණු 20කි.

ඉගෙනුම් පල -

- පිල්ලම් නිවැරදි ව භාවිත කරයි.
- අක්ෂර වින්‍යාසය පිළිබඳ රීති අනුගමනය කරමින් ලියයි.
- පොතපත කියවීමෙන් පුළුල් කර ගත් වාක්කෝෂය භාෂා කාර්යයේ දී භාවිත කරයි.
- විවිධ සන්ධි වර්ග හඳුනාගෙන නම් කරයි.
- සම්මත භාෂා රීති අනුගමනය කරමින් වාක්‍ය ලියයි.
- නාම පදවල ප්‍රකෘති හඳුනාගෙන වෙන් කරයි.

**1.** (i) සිට (x) තෙක් ඇති **සියලු ම** අනුකොටස්වලට කෙටි උත්තර ලියන්න. කිසියම් අනුකොටසකට උත්තර **නොලියන්නේ නම්, එහි අංකය ලියා ඉදිරියෙන් ඉරක් අඳින්න.**

(i) පහත සඳහන් එක් එක් පිල්ල නියෝජනය කරන ස්වර අක්ෂරය ලියන්න.

(අ) කෙටි ඉස්පිල්ල - ඉ
(ආ) ඇලපිල්ල - ආ

(ii) පහත සඳහන් වාක්‍යයේ ඇතුළත් නිපාතයක් සහ යුගල පදයක් උපුටා ලියන්න.

"ජීවිතයේ සැඳෑ සමය ගෙවන වැඩිහිටියන්ට අපි නිතර උදවු උපකාර කළ යුත්තෙමු."

නිපාතය - නිතර
යුගල පදය - උදවු උපකාර

(iii) පහත සඳහන් පද සන්ධි කර ලියන්න.

(අ) සිය + ඇසින් (ආ) සිති + කම්

(අ) සිය + ඇසින් - සියැසින්
(ආ) සිති + කම් - සිතියම්

(iv) පහත සඳහන් වාක්‍යයේ අක්ෂර වින්‍යාස දෝෂ සහිත වචන දෙකක් ඇත. එම වචන **දෙක පමණක්** නිදොස් කර ලියන්න.

මතකයේ රැඳෙන සහ ක්ෂනික ව අර්ථ ග්‍රහණය කළ හැකි පරිදි භාෂාව භාවිත කිරීම සාර්ථක දැන්වීම්කරනයේදී අත්‍යවශ්‍ය අංගයකි.

ක්ෂනික - ක්ෂණික
දැන්වීම්කරනයේදී - දැන්වීම්කරණයේදී

(v) පහත සඳහන් නාම පදවල ප්‍රකෘතිය හා ප්‍රත්‍යයය වෙන් කර ලියන්න.

(අ) වඳුරා (ආ) කපුටෝ

(අ) වඳුරා - වඳුරු + ආ
(ආ) කපුටෝ - කපුටු + ඕ



අ.පො.ස සාමාන්‍ය පෙළ සියලුම විෂයන්ට අදාල ප්‍රශ්න පත්‍ර/පිළිතුරු පත්‍ර/සටහන් ලබා ගැනීමට Past Papers Wiki වෙත පිවිසෙන්න
CamScanner

(vi) පහත සඳහන් වාක්‍යයේ ඇතුළත් තද්ධිත පද **දෙකක්** ලියන්න.
රටේ දියුණුව වෙනුවෙන් දේශීය කර්මාන්ත නගා සිටුවීම කාලීන වශයෙන් ඉතා වැදගත් වේ.

දේශීය, කාලීන

(vii) පහත සඳහන් පද අයත් වන සමාස වර්ගය ලියන්න.
(අ) දිගුවරල
(ආ) අප්‍රමාණ

(අ) දිගුවරල - විශේෂණ සමාසය

(ආ) අප්‍රමාණ - අව්‍යය සමාසය

(viii) පහත සඳහන් වාක්‍යයේ ඇතුළත් කෘදන්ත පද **දෙකක්** ලියන්න.
ක්‍රීඩා උත්සවය නැරඹීම සඳහා පැමිණි ප්‍රේක්ෂකයෝ ක්‍රීඩාපිටිය වටා නැටුම් සන්දර්ශන ද පවත්වමින් ප්‍රීති වූහ.

නැරඹීම, පැමිණි, නැටුම්, සන්දර්ශන

(ix) පහත දැක්වෙන වාක්‍ය සදොස් ය. ඒවා නිදොස් කර නැවත ලියන්න.
(අ) නළුවන්, නිළියන් සමග වේදිකාවට අවතීර්ණ වූහ.
(ආ) ඔවුහු පුවත්පත් වාර්තාකරුවෝ මෙන් පෙනී සිටියහ.

(අ) නළුවෝ නිළියන් සමග වේදිකාවට අවතීර්ණ වූහ.

(ආ) ඔවුහු පුවත්පත් වාර්තාකරුවන් මෙන් පෙනී සිටියහ.

(x) පහත සඳහන් වාක්‍ය කර්තෘකාරකයට හරවන්න.
(අ) වෛද්‍ය ශිෂ්‍යයන් විසින් රෝගීහු නිරීක්ෂණය කරනු ලබති.
(ආ) සේවකයන් විසින් ආයතන ප්‍රධානියාට උපහාර උත්සවයක් සංවිධානය කරන ලදි.

(අ) වෛද්‍ය ශිෂ්‍යයෝ රෝගීන් නිරීක්ෂණය කරති.

(ආ) සේවකයෝ ආයතන ප්‍රධානියාට උපහාර උත්සවයක් සංවිධානය කළහ/කළෝ ය.



CamScanner

**ප්‍රශ්න අංකය 02**

**අපේක්ෂණය - විශ්ලේෂණ හැකියාව මැනීම**

මේ ප්‍රශ්නය සැකසීමේ දී අනුගමනය කර ඇත්තේ මාර්ගෝපදේශිත රචනා මූලධර්මය යි. එනම් ඉදිරිපත් කොට ඇති මග පෙන්වීම ප්‍රයෝජනයට ගනිමින් කිසියම් රචනාවක් ලිවීමට අපේක්ෂකයාට ඉඩ සැලැස්වීම යි. රචනයේ ඇතුළත් විය යුතු කරුණු, විස්තරය ඇසුරෙන් වටහා ගත යුතු ය. රචනයෙහි අන්තර්ගත විය යුතු ඡේද සංඛ්‍යාව ගැන වැටහීමක් දී ඇති විස්තරයෙන් ලබා ගත හැකි ය. මාතෘකාව ඉදිරිපත් කොට නැතත්, ඉදිරිපත් කොට ඇති විස්තර ඇසුරෙන් අපේක්ෂකයා මාතෘකාව සකස් කර ගත යුතු ය.

ඉගෙනුම් පල -

- ➢ රචනා මාතෘකාවට අදාළ ව කරුණු රැස් කරයි.
- ➢ රැස් කර ගත් කරුණු තර්කානුකූල ව පෙළගස්වයි.
- ➢ ශිල්පීය දක්ෂතා අනුගමනය කරමින් රචනා ලියයි.
- ➢ නිර්මාණාත්මක ලේඛනයේ යෙදෙයි.

**2.** පහත දැක්වෙන **(අ)**, **(ආ)**, **(ඉ)**, **(ඊ)** යන විස්තර අතුරෙන් **එකක්** තෝරා ගෙන **වචන 250කට නො අඩු** වන සේ රචනයක් ලියන්න. වරහන් තුළ ඇති අක්ෂරය ඔබේ උත්තර පත්‍රයේ ලියා රචනය ලිවීම ආරම්භ කරන්න. රචනය සඳහා **යෝග්‍ය මාතෘකාවක්** ද යොදන්න.

**(අ)** ලෝකයේ බොහෝ රටවල් ආර්ථික සංවර්ධනය කරා ළඟා වීමේදී නිෂ්පාදන ආර්ථිකය කෙරෙහි ද ප්‍රමුඛ අවධානයක් යොමු කර ඇත. ඒ අයුරින් ශ්‍රී ලංකාව ද නිෂ්පාදන ආර්ථිකය නගා සිටුවීම සඳහා කඩිනම් ක්‍රියාමාර්ග ගත යුතු ව ඇත. මෙහිදී යටිතල පහසුකම් සංවර්ධනය, මානව සම්පත් සංවර්ධනය, විදේශීය ආයෝජන ආකර්ෂණය කර ගැනීම, කාර්මික හා තාක්ෂණික කර්මාන්ත සංවර්ධනය ආදිය ශක්තිමත් නිෂ්පාදන ආර්ථිකයකට පදනම සපයනු ඇත. ඒ වෙනුවෙන් රාජ්‍ය හා පෞද්ගලික අංශයේ සක්‍රිය දායකත්වය ද අඛණ්ඩ ව ලැබිය යුතු ය.

(i) නිෂ්පාදන ආර්ථිකය නගා සිටුවීමට ගත හැකි ක්‍රියාමාර්ග

(ii) ආර්ථික සංවර්ධනය සඳහා රාජ්‍ය හා පෞද්ගලික අංශයේ දායකත්වය

(iii) නිෂ්පාදන ආර්ථිකයේ පදනම ලෙස කාර්මික හා තාක්ෂණික කර්මාන්ත සංවර්ධනය

**(ආ)** පොලිතීන් ආශ්‍රිත ද්‍රව්‍ය අධික ලෙස පරිසරයට එක්වීම නිසා පාරිසරික හා සමාජ ගැටලු රැසක් පැන නැඟී ඇත. මේ සඳහා ශ්‍රී ලංකාවේ විවිධ පාර්ශ්ව වෙතින් බොහෝ විසඳුම් ද ඉදිරිපත් වනු නිරීක්ෂණය කළ හැකි ය. එම විසඳුම්වල ප්‍රායෝගික භාවිතය පිළිබඳ පුළුල් සමාජ සාකච්ඡාවක් ඇති වී තිබීම ද වගකිව යුතු පාර්ශ්වවල අවධානයට ලක්විය යුත්තකි. කෙසේ වුවත් පොලිතීන් වෙනුවට පරිසර හිතකාමී ආදේශක භාවිතය ප්‍රවර්ධනය, හා විධිමත් ප්‍රතිචක්‍රීකරණ ක්‍රියාවලි නිසි පරිදි සිදු කිරීම ආදියෙන් බොහෝ අතිරේක වාසි ද හිමි වේ.

(i) පොලිතීන් වෙනුවට පරිසර හිතකාමී ආදේශක භාවිතයේ වැදගත්කම

(ii) පොලිතීන් භාවිතය නිසා මතුවන පාරිසරික හා සමාජ ගැටලු

(iii) පොලිතීන් වෙනුවට ප්‍රතිචක්‍රීකරණය කළ හැකි ආදේශක ඇසුරුම් ප්‍රවර්ධනය

(iv) පොලිතීන් නිසා මතුවන සමාජ පාරිසරික ගැටලුවලට විසඳුම්



අ.පො.ස සාමාන්‍ය පෙළ සියලුම විෂයන්ට අදාල ප්‍රශ්න පත්‍ර/පිළිතුරු පත්‍ර/සටහන් ලබා ගැනීමට Past Papers Wiki වෙත පිවිසෙන්න
CamScanner

(ඉ) වර්තමානයේ ශ්‍රී ලංකාවේ රිය අනතුරු බහුල ව සිදු වන අතර එය මේ වන විට සමාජ ඛේදවාචකයක් බවට පත් වී ඇත. රියැදුරන්ගේ නොසැලකිලිමත් බවට අමතර ව තවත් හේතු සාධක රැසක් ද මේ සඳහා බලපායි. මෙයට විසඳුමක් ලෙස ප්‍රථමයෙන් දැනුමෙන් හා ආකල්පවලින් පොහොසත් පුහුණු රියැදුරු ප්‍රජාවක් බිහි කර ගැනීමට වැඩපිළිවෙළක් සකස් කළ යුතු ය. එසේ ම රිය අනතුරු වළක්වා ගැනීම සඳහා මගීන්ගේ දායකත්වය ද සුළු කොට තැකිය නොහැකි ය. රථවාහන නීති බලාත්මක කිරීමට අමතර ව රිය අනතුරු කළමනාකරණය හා වළක්වා ගැනීම ආදිය සම්බන්ධයෙන් වගකිව යුතු අංශවල දායකත්වය ද අඛණ්ඩ ව ලැබිය යුතු ය.

(i) මාර්ග අනතුරු වළක්වා ගැනීමේ ක්‍රමෝපාය
(ii) දැනුමෙන් හා ආකල්පවලින් පොහොසත් රියැදුරු ප්‍රජාවක අවශ්‍යතාව
(iii) රිය අනතුරු වළක්වා ගැනීමට මගීන්ගේ හා රියැදුරන්ගේ දායකත්වය
(iv) මාර්ග අනතුරු අවම කිරීම සඳහා අනතුරු කළමනාකරණයේ වැදගත්කම

(ඊ) කුඩා අවධියේ සිට ම පොත්පත්වලට නිරාවරණය වීම සහ දිගුකාලීන අධ්‍යාපන සාර්ථකත්වය අතර ධනාත්මක සහසම්බන්ධතාවක් පවතින බවට නූතන පර්යේෂණවලින් සොයා ගෙන ඇත. ඒ සඳහා ලබා දිය හැකි දේශීය හා විදේශීය උදාහරණ ද රැසකි. පොත් කියවීමේ කුසලතාව අඛණ්ඩ ව පුහුණු කළ විට අත් වන ප්‍රයෝජන ද අසීමිත ය. එහෙත් සමාජ මාධ්‍ය භාවිතයේ අධිකතර බව නිසා පොත් කියවීමේ පුරුද්ද ගිලිහී යමින් පවතින බවට මතවාද ඉදිරිපත් වී තිබේ. තාක්ෂණික දියුණුවත් සමග ම පොත් කියවීමේ කුසලතාව සංවර්ධනය කිරීමේ අභියෝගය ජය ගැනීමට විධිමත් උපාය මාර්ග සෙවිය යුතු ය.

(i) දිගුකාලීන අධ්‍යාපන සංවර්ධනය සඳහා කියවීමේ වැදගත්කම
(ii) කියවීම ප්‍රගුණ කිරීම සඳහා තාක්ෂණය භාවිත කළ හැකි ආකාරය
(iii) යහපත් අධ්‍යාපන සංවර්ධනයක් සඳහා පොත් කියවීමේ කුසලතාවෙන් ලැබිය හැකි ප්‍රයෝජන

**ලකුණු විග්‍රහය - මුළු ලකුණු 25 යි.**

01. සාරවත්භාවය, මාතෘකාව ද ඇතුළු ව - ලකුණු 08 යි.
02. සංවිධානය, නිර්මාණාත්මකභාවය හා ස්වීයත්වය - ලකුණු 12 යි.
03. ශිල්පීය දක්ෂතා සහ ඡේද බෙදා ලිවීම - ලකුණු 05 යි.

01. සාරවත්භාවය - ලකුණු 07 යි.
විස්තරයට අදාළ වන පරිදි මාතෘකාවක් යොදා තිබීම - ලකුණු 01 යි.

තේමාවට අදාළ බව, ඉදිරිපත් කොට ඇති ව්‍යූහයට සමීප බව, සරු බව හා සම බව, වචන ගණන 250 සමීප ව පැවතීම යන කරුණු සාරවත්භාවය යටතේ සැලකිල්ලට ගත යුතු වේ.

02. සංවිධානය, නිර්මාණාත්මකභාවය හා ස්වීයත්වය - ලකුණු 12 යි.
මෙහි දී උසස් ප්‍රකාශන ශක්තිය, සංවිධානය, ස්වීයත්වය, නිර්මාණාත්මක ප්‍රකාශනය, ව්‍යක්ත ලේඛන ව්‍යවහාරය ආදි අංශ ගැන සලකා බැලිය යුතු ය.

03. ශිල්පීය දක්ෂතා සහ ඡේද බෙදා ලිවීම - ලකුණු 05 යි.
වියරණ, අත් අකුරු, විරාම ලක්ෂණ භාවිතය, ඡේද අදාළ පරිදි වෙන් කොට තිබීම, පද වෙන් කොට ලිවීම යන අංශ ගැන සලකා බලා ලකුණු තීරණය කළ යුතු වේ.

❖ **සැලකිය යුතු යි.**

01. රචනයේ වචන ගණන දළ වශයෙන් 200ට වඩා අඩු වන කල්හි ඉහත දක්වූ 1, 2, 3 යන කොටස්වලට ආනුපාතික ව ලකුණක් තීරණය කළ යුතු වේ.
02. වැදගත් අදහස්, සිත් ගන්නා ප්‍රකාශන ඇති තැන්වල (✓) යොදන්න. වැරදි තැන්වල (x) ලකුණු යොදන්න.



Past Papers Wiki
CamScanner

03. උක්තාඛ්‍යාත සම්බන්ධ වැරදි තැන් යටින් ඉරක් අඳින්න. අක්ෂර වින්‍යාසය වැරදි වචන වටා රවුමක් අඳින්න.

1, 2, 3 යන කොටස් සඳහා දෙන ලද ලකුණු උත්තරය අග හරස් අතට ලියා එකතු කර, මුළු ලකුණු ගණන ලබා ගන්න.

නිදසුන් - $\frac{6}{8}$ $\frac{9}{12}$ $\frac{3}{5}$ $\frac{18}{25}$

සංලක්ෂය - ★ වාක්‍ය රචනා ඇගයීමට පෙර අදාළ ව්‍යුහය කියවා දළ සැලැස්මක් සකස් කර ගන්න. ව්‍යුහයට කිසිසේත් අදාළ නොවන සේ ලියා ඇති රචනා ඇගයීමේ දී සාරවත්භාවය සඳහා පිරිනැමිය යුත්තේ ඉතා අඩු ලකුණකි.

රචනය දුර්වල වුවත් මුළු ලකුණු වශයෙන් බින්දුව නො දෙන්න.
සමස්තයක් ලෙස සලකා ලකුණු 02 - 05 අතර සංඛ්‍යාවක් පිරිනමන්න. උපරිම ලකුණු 05 ඉක්මවිය යුතු නො වේ.

සාරවත්භාවය මාතෘකාව ද ඇතුළු ව - ලකුණු 08

| | |
|---|---|
| මාතෘකාව ද සහිත ව සාරවත් කරුණු ප්‍රමාණවත් ව ඉදිරිපත් කිරීම, මාතෘකාව රචනාවට ගැළපෙන බව, මනා භාෂා භාවිතය, තේමාවට අදාළ ව ලියා තිබීම, සරු බව හා සම බව නිවැරදි ව රැක තිබීම, වචන 250ට සමීප ව පැවතීම. | 8-7 |
| සාරවත් කරුණු කිහිපයක් පමණක් ඉදිරිපත් කිරීම, මාතෘකාව ද රචනාවට ගැළපෙන පරිදි යොදා තිබීම, භාෂා ශෛලිය තරමක් හොඳින් පැවතීම, තේමාවට අදාළ බව තරමක් දුරස්වීම, සම බවෙහි හා සරු බවෙහි තරමක් දුර්වලතා පැවතීම, වචන ගණන 200ට වඩා අඩුවීම. | 6-5 |
| සාරවත් කරුණු ප්‍රමාණවත් පරිදි නොතිබීම, භාෂා ශෛලියේ දුර්වලතා පැවතීම, තේමාවට අදාළ නොවීම, මාතෘකාවක් යොදා තිබීම, සරු බව හා සම බව නොපැවතීම, වචන ගණන 200ට අඩුවීම. | ලකුණු 4ට අඩු |

සංවිධානය, නිර්මාණාත්මකභාවය හා ස්වීයත්වය - ලකුණු 12

| | |
|---|---|
| උසස් ප්‍රකාශන ශක්තිය, මැනවින් කරුණු සංවිධානය කර තිබීම, ස්වීයත්වය ප්‍රදර්ශනය කිරීම, නිර්මාණාත්මක ව ලියා තිබීම, නිරවුල් බව, ව්‍යක්ත ලේඛන ව්‍යවහාරය භාවිත කිරීම. | 12-10 |
| ප්‍රකාශන ශක්තියෙහි දුර්වලතා තරමක් පැවතීම, කරුණු සංවිධානයේ දී දුර්වලතා තරමක් පැවතීම. | 9-7 |
| ප්‍රකාශන ශක්තියෙහි දුර්වලතා තරමක් පැවතීම, කරුණු සංවිධානය කර ගැනීමේ දී දුර්වලතා දක්නට ලැබීම,<br>ස්වීයත්වයෙහි ගැටලු දක්නට ලැබීම,<br>නිර්මාණාත්මක ව කරුණු ඉදිරිපත් කිරීමේ ගැටලු පැවතීම,<br>භාෂා ව්‍යවහාරයෙහි දුර්වලතා පැවතීම. | 6-4 |
| ප්‍රකාශන ශක්තියෙහි බොහෝ දුර්වලතා පැවතීම<br>කරුණු සංවිධානය කර ගැනීමේ දී බොහෝ දුර්වලතා දක්නට ලැබීම,<br>ස්වීයත්වය ප්‍රදර්ශනය නොකිරීම,<br>නිර්මාණාත්මකභාවය දක්නට නොලැබීම,<br>නිරාකුල වූ භාෂාවක් භාවිත නොකිරීම,<br>භාෂා ව්‍යවහාරයේ බොහෝ දුර්වලතා පැවතීම. | 3-1 |

ශිල්පීය දක්ෂතා - ලකුණු 05

| | |
|---|---|
| ව්‍යාකරණ රීති නිවැරදි ව අනුගමනය කර තිබීම,<br>පැහැදිලි අත්අකුරු භාවිත කිරීම,<br>විරාම ලක්ෂණ නිවැරදි ව භාවිත කිරීම,<br>නිවැරදි ඡේද වෙන් කිරීම,<br>අක්ෂර වින්‍යාස රීති භාවිතය. | 5 |
| ව්‍යාකරණ දෝෂ, අපැහැදිලි අත්අකුරු, විරාම ලක්ෂණමය දෝෂ, අක්ෂර දෝෂ තරමක් පැවතීම. | 4-3 |
| ඉහත දෝෂ බහුල වීම. | 1 |



අ.පො.ස සාමාන්‍ය පෙළ සියලුම විෂයන්ට අදාල ප්‍රශ්න පත්‍ර/පිළිතුරු පත්‍ර/සටහන් ලබා ගැනීමට Past Papers Wiki වෙත පිවිසෙන්න
CamScanner

## ප්‍රශ්න අංකය 03

**අපේක්ෂණය** - කිසියම් කොටසක් කියවා, විස්තර වර්ණනා බැහැර කරමින්, එහි හරය වටහා ගෙන, ඒ ඇසුරින් සමස්ත අර්ථය, තම වචනයෙන් ඉදිරිපත් කිරීමේ හැකියාව මෙහි දී ඇගයේ. ඒ අනුව සංශ්ලේෂණ හැකියාව මෙහි ලා විමසීමට ලක් කෙරේ.

ඉගෙනුම් පල -

- ➢ ලිපි ලේඛනවලින් වැදගත් කරුණු වෙන් කොට දක්වයි.
- ➢ වැදගත් කරුණු අර්ථවත් ව ගළපා ඉදිරිපත් කරයි.
- ➢ මුල් ලේඛනයේ අදහස් ආරක්ෂා වන පරිදි සාරාංශ කර දක්වයි.

**3.** පහත දැක්වෙන පාඨය වචන **65 - 75** අතර වන සේ **සාරාංශ කොට** ලියන්න. ඔබ යෙදූ වචන සංඛ්‍යාව සාරාංශය අග ලියන්න.

පරිපාලනය විශ්ව ව්‍යාප්ත ක්‍රියාවලියක් ලෙස සැලකුණ ද එය පහසුවෙන් අවබෝධ කර ගත හැකි ක්‍රියාවලියක් නො වේ. එමෙන් ම ඇතැමෙකුට එය අනවශ්‍ය ක්‍රියාවලියක් වශයෙන් අර්ථකථනය කළ හැකි වුව ද සෑම නූතන සමාජයක ම අනිවාර්යයෙන් ම පැවතිය යුතු ක්‍රියාවලියක් බවට පත් ව ඇත. කෙසේ වුව ද පරිපාලනය යනුවෙන් හැඳින්වෙනුයේ මිනිස් වැඩ කටයුතු නිසි පරිදි කළමනාකරණය කිරීම වේ. මානවයා ප්‍රභවය ලත් වකවානුවේ සිට ම මේ ක්‍රියාවලියේ ආරම්භය සිදු වී ඇත. මුල් ම අවධිවල ගෝත්‍රික නායකයන්ට පැවරී තිබුණේ මේ කාර්යභාරය යි. නූතන සමාජයේ පවතින කවර මාදිලියක හෝ ආයතනයක ප්‍රධානියා විසින් සිදු කරනු ලබන්නේ ද මේ ක්‍රියාවලිය ම ය.

නූතන සමාජයේ පරිපාලන ක්‍රියාවලියට අයත් වන සමාජ කාර්යභාරයන් සහ සංකීර්ණ සංවිධාන ව්‍යූහය දෙස බලන විට පැහැදිලි වනුයේ ඒවා යම් සමාජ අරමුණක් ඉටු කර ගැනීමේ පරමාර්ථයෙන් සකස් කර ඇති බව යි. මෙහි පළමු පියවර වන්නේ ඒ ඒ සමාජ කාර්යභාරයන් හඳුනා ගැනීම යි. දෙවන පියවර වන්නේ ඒවා පිළිවෙළකට සංවිධානය කිරීම සහ සම්බන්ධීකරණය යි. අවසන් පියවර වන්නේ ඒවා ක්‍රියාත්මක කිරීම යි. මේ ක්‍රියාවලියට පුද්ගල සමූහයකගේ දායකත්වය අවශ්‍ය වේ. ඔිනෑ ම මානව සමාජයක යහපැවැත්ම උදෙසා මේ පරිපාලන ක්‍රියාවලිය බෙහෙවින් ම වැදගත් වේ. රටක මානව සම්පත් සංවර්ධනය හා භෞතික සම්පත් සංවර්ධනය සෘජු ව ම මේ පරිපාලන ක්‍රියාවලිය හා බද්ධ ව පවතී. මෙරට සාම්ප්‍රදායික පරිපාලන ව්‍යූහය පිළිබඳ සලකා බැලීමේදී වරිග සභා, ගම් සභා සහ රට සභා වැනි ඒකකවලින් සිදු ව ඇත්තේ ද මේ කාර්යභාරය ම බව හඳුනාගත හැකි ය. ඒ අනුව පරිපාලන ක්‍රියාවලිය ඕනෑ ම රටක අතීතයේ සිට වර්තමානය දක්වා අඛණ්ඩ ව ක්‍රියාත්මක වෙමින් පවතින ක්‍රියාවලියක් බව පැහැදිලි ය.

**(ලකුණු 10 යි.)**

සාරාංශය

- ❖ පරිපාලන ක්‍රියාවලිය නූතනයේ දී අත්‍යවශ්‍ය වීම
- ❖ මානවයා ප්‍රභවය ලත් වකවානුවේ සිට නූතන සමාජය දක්වා ම එහි විකාසනය සිදු වී තිබීම
- ❖ එය යම් සමාජ අරමුණක් ඉටු කර ගැනීමේ පරමාර්ථයෙන් සකස් වී ඇති බව
- ❖ මෙය පියවර තුනකින් සමන්විත වීම
- ❖ සාමූහික වැදගත් ක්‍රියාවලියක් වන පරිපාලනය මානව හා භෞතික සම්පත් සංවර්ධනයට සෘජු ව ම බද්ධ වීම
- ❖ මෙම ක්‍රියාවලිය අතීතයේ සිට මේ දක්වා අඛණ්ඩ ව ක්‍රියාත්මක වෙමින් පැවතීම



CamScanner

**සාරාංශකරණය:**

**මුළු ලකුණු ප්‍රමාණය 10 යි.**

**ලකුණු විග්‍රහය:**

01. අන්තර්ගතය - ලකුණු 06 යි.
02. වචන ගණන - ලකුණු 02 යි.
03. ශිල්පීය දක්ෂතා - ලකුණු 02 යි.

* වචන ගණන 75 ඉක්මවන කල්හි මුල් වචන 70 පමණක් ඇගයීමට ලක් කරන්න.
* වචන ගණන 55ට අඩු කල්හි එහි ඇතුළත් අදහස් පමණක් සැලකිල්ලට ගෙන ලකුණු පිරිනමන්න.
* ඡේද බෙදා තිබුණහොත් ශිල්පීය දක්ෂතා කොටසින් ලකුණක් අඩු කරන්න.
* එක යට එක අසම්බන්ධිත වාක්‍ය ලෙස ලියා ඇත්නම් අන්තර්ගතයට දිය හැකි උපරිම ලකුණු ගණන 02කි.
* වචන ගණන 75ට වැඩි කල්හි හෝ 55ට අඩු කල්හි ලකුණක් අඩු කරන්න.
* දුර්වල සාරාංශ සඳහා බින්දුව නො දී ලකුණු 03ක උපරිමයකට යටත් ව ලකුණු පිරිනමන්න.

සාරාංශයේ අන්තර්ගතය සඳහා ලකුණු පිරිනැමීම - ලකුණු 06

| | |
|---|---|
| ප්‍රධාන කරුණු ඉදිරිපත් කර තිබීම, වාක්‍ය අතර සම්බන්ධතාව ප්‍රශස්ත මට්ටමින් පවත්වා ගැනීම, නිරවුල් ව කරුණු ඉදිරිපත් කිරීම, වචන ගණන අදාළ සීමාව තුළ පැවතීම. | ලකුණු 05-06 |
| ප්‍රධාන කරුණු කිහිපයක් පමණක් ඇතුළත් වීම,<br>වාක්‍ය අතර සම්බන්ධතාව තරමක් රැක ගැනීම,<br>වචන ගණන 55-65 අතර පැවතීම, නිරවුල්බව රැකගැනීම. | ලකුණු 03-04 |
| ප්‍රධාන කරුණු ස්වල්පයක් වත් ඉදිරිපත් කර තිබීම,<br>වාක්‍ය අතර සම්බන්ධතාව ගිලිහී තිබීම,<br>වචන ගණන 55ට අඩු වීම, නිරවුල් බව ගිලිහී තිබීම. | ලකුණු 01-02 |



අ.පො.ස සාමාන්‍ය පෙළ සියලුම විෂයන්ට අදාල ප්‍රශ්න පත්‍ර/පිළිතුරු පත්‍ර/සටහන් ලබා ගැනීමට Past Papers Wiki වෙත පිවිසෙන්න
CamScanner

**ප්‍රශ්න අංකය 04**

**අපේක්ෂණය** - ඉදිරිපත් කොට ඇති ඡේදය ඇසුරින් අවබෝධය පිළිබඳ හැකියාව මැනීම

ඉගෙනුම් පල -

- අවබෝධයෙන් යුතු ව පොත පත කියවයි.
- කියවා අවබෝධ කර ගත් කරුණු ඉදිරිපත් කරයි.

**4.** පහත දක්වෙන පාඨය කියවා අසා ඇති ප්‍රශ්නවලට **පිළිතුරු** සපයන්න.

ලංකාවේ නිෂ්පාදනයන්ගෙන්, ඉන්දියාවේදී අලෙවි කළ හැකි වූයේ, අලි ඇතුන්, පුවක්, සක් බෙල්ලන් සහ මුතු පමණ ය. ලංකාවේ සංඛ්‍යාත්මක ව විශාල ප්‍රමාණයක් වූ අලි ඇතුන් විකිණීමෙන් මහත් ආදායමක් ලබා ගත හැකි විය. දිවයින අභ්‍යන්තරයෙහි, ජනාවාස වල්බිහි වී වනාන්තරය පැතිරී යාම නිසා ඇතුන්ගේ ගණන ඉතා විශාල වශයෙන් වැඩි වී ගොස් තිබුණු අතර මේ කාලයේදී මහත් ආයාසයක් නොමැති ව ඔවුන් අල්වා ගෙන හීලෑ කිරීමට හැකි විය. ඉතා දක්ෂ උපායකින්, අලි ඇතුන් ඇල්ලීම ගැන විශේෂඥ නිපුණතාවක් ඇති ව සිටි එක්තරා කුලයකට අයත් මිනිස්සු කොටසක් සිටියහ. ඉන්දියානු රජවරුන් යුද්ධ කටයුතු, බර ඇදීම සහ ස්වකීය කකුධ භාණ්ඩවල එක් අංගයක් වශයෙන් ද පාවිච්චි කිරීම සඳහා අලි ඇතුන් ලබා ගැනීමට උත්සාහ කිරීම නිසා ඔවුන් උදෙසා ඉන්දියාවේ වෙළෙඳපොළක් තිබුණේ ය. විශේෂයෙන් ම උතුරු ඉන්දියාවේ ප්‍රබල රජවරුන් අතර ඇතුන් සඳහා විශාල ඉල්ලුමක් තිබුණේ ය. ප්‍රමාණයෙන් ඉතා විශාල වීමත්, තැනින් තැන ගෙන යාම ඉතා අපහසු වීමත් නිසා ඉන්දියාවේදී ඔවුන් සඳහා අධික මිලක් ලබා ගත හැකි විය. ඉන්දියාවත් සමග ලංකාව ගෙන ගිය මේ ඇතුන් වෙළෙඳාම ඉතා පැරණි එකක් වූ අතර, එය පටන් ගන්නා ලද්දේ, නැගෙනහිර ලෝකයේ යුරෝපීය වෙළෙඳාමට බොහෝ කලකට පෙර ය.

පුවක් වූ කලි, මීට වඩා බෙහෙවින් වෙනස් වූ වෙළෙඳ භාණ්ඩයක් විය. එහි ප්‍රධාන ලක්ෂණය වූයේ, එයට තිබූ ඉතා විශාල වූ ඉල්ලුමත්, එහි ප්‍රතිඵලයක් වශයෙන් එයට තිබූ පෘථුල වෙළෙඳපොළත් ඉල්ලුමට සම වන අන්දමින් එය සුලභ ව තිබීමත් ය. තාල වර්ගයට අයත්, පුවක් නමින් හැඳින්වෙන ගස් වර්ගයක හට ගන්නා ගෙඩි වර්ගයක් වූ එය දිවයිනේ සෑම පළාතක ම, සෑම ගෙවත්තක ම පාහේ වැවෙන ගස් වර්ගයකි. මෙම ගෙඩි වර්ගය, සාමාන්‍යයෙන් ලංකාවේත් ඉන්දියාවේත් ජනයා විසින් බුලත් සමග විට කෑම සඳහා ප්‍රයෝජනයට ගනු ලැබිණි.

(i) ලංකාවට විශාල ආදායමක් උපයා ගත හැකි වූයේ කවර සතුන් විකිණීමෙන් ද?
(ii) දක්ෂ උපාය යොදමින් අලි ඇතුන් ඇල්ලීමෙහි නිරත වූවෝ කවරහු ද?
(iii) ඉන්දීය රජවරුන් අලි ඇතුන් පාවිච්චි කිරීමට බලපෑ හේතු කීයක් මෙහි දැක්වේ ද?
(iv) අලි ඇතුන් සඳහා විශාල ඉල්ලුමක් පැවතියේ කවර රජවරුන් අතර ද?
(v) පුවක් අයත් වන්නේ කවර වර්ගයේ ශාක විශේෂයකට ද?

(ලකුණු 02 × 5 = 10 යි.)

(i) අලි ඇතුන් විකිණීමෙන්

(ii) විශේෂඥ නිපුණතාවක් ඇති ව සිටි එක්තරා කුලයකට ~~අයත් මිනිස්සු~~ O

(iii) තුනක්/ 03 .

(iv) උතුරු ඉන්දියාවේ ප්‍රබල රජවරුන් අතර

(v) තාල වර්ගයට



CamScanner

**ප්‍රශ්න අංකය 05**

**අපේක්ෂණය** - ප්‍රායෝගික ලේඛන හැකියාව පිළිබඳ අපේක්ෂකයා සතු කුසලතා මැනීම

ඉගෙනුම් පල -

- ප්‍රායෝගික ලේඛනයේ දී ශිල්පීය උපක්‍රම අනුගමනය කරයි.
- අවශ්‍යතා අනුව විවිධ ප්‍රායෝගික ලේඛන සකස් කරයි.

**5.** **වැසි සමයෙන් අනතුරු ව බෝ වන රෝගවලට ගොදුරු වීම සිතුම්පුර ජනතාව නිරන්තරයෙන් මුහුණ දෙන ගැටලුවකි. ඒ පිළිබඳ ව ඔවුන් දැනුවත් කිරීමට සුදුසු අත්පත්‍රිකාවක් සකස් කරන්න. අත්පත්‍රිකාවට පහත සඳහන් කරුණු ඇතුළත් විය යුතු ය.**

- බෝ වන රෝග ඇති වීමට හේතු
- එයින් මිදීමට ගත හැකි ක්‍රියාමාර්ග
- ජනතාව වෙත ලබා දෙන උපදෙස්
- ජනතාවගෙන් අපේක්ෂා කරන සහාය

**සිතුම්පුර ප්‍රාදේශීය සෞඛ්‍යාරක්ෂණ කමිටුවේ ලේකම් රවිඳු ජයශාන්ත ඔබ යයි සිතන්න.**

**නැතහොත්**

සාරගම විද්‍යාදීප විද්‍යාලයේ කලා සංගමය මගින් චිත්‍ර ප්‍රදර්ශනයක් පැවැත්වීමට සැලසුම් කර ඇත. ඒ සඳහා චිත්‍ර ඉදිරිපත් කිරීමට සිසුන් දැනුවත් කිරීම සඳහා සුදුසු දැන්වීම් පත්‍රිකාවක් සකස් කරන්න. කලා සංගමයේ ලේකම් රවිඳි වරුසමාන ඔබ යයි සිතන්න. දැන්වීමෙහි පහත සඳහන් කරුණු ඇතුළත් විය යුතු ය.

- චිත්‍රවල තේමාව
- භාවිත කළ හැකි මාධ්‍ය
- චිත්‍රවල ප්‍රමාණය
- භාර දිය යුතු දිනය

(ලකුණු 15 යි.)

**අත්පත්‍රිකාව - ලකුණු 15 යි.**

ලකුණු විග්‍රහය - මුළු ලකුණු 15 යි.

1, 2, 3 යන අංශ සඳහා ලකුණු වෙන් වෙන් ව දී ලකුණු එකතුව ලබා ගන්න.

| | | |
|---|---|---|
| 01. | ආකෘතිය සඳහා | **ලකුණු 04 යි.** |
| 02. | අන්තර්ගතය සඳහා | **ලකුණු 08 යි.** |
| 03. | ශිල්පීය දක්ෂතා සඳහා | **ලකුණු 03 යි.** |

01. <u>ආකෘතිය සඳහා ලකුණු 04 යි.</u>

| | | |
|---|---|---|
| 1. | මාතෘකාව | **ලකුණු 01 යි.** |
| 2. | පළකරන්නාගේ නම, තනතුර | **ලකුණු 01 යි.** |
| 3. | පළකරන දිනය | **ලකුණු 01 යි.** |
| 4. | නිර්මාණාත්මක භාවය | **ලකුණු 01 යි.** |

02. <u>අන්තර්ගතය සඳහා ලකුණු 08 යි.</u>

| | | |
|---|---|---|
| 1. | බෝවන රෝග ඇති වන හේතු<br>(හේතු 2ක් තිබිය යුතු ය) | **ලකුණු 02 යි.** |
| 2. | එයින් මිදීමට ගත හැකි ක්‍රියාමාර්ග<br>(ක්‍රියාමාර්ග 2ක් තිබිය යුතු ය) | **ලකුණු 02 යි.** |
| 3. | ජනතාව වෙත ලබා දෙන උපදෙස්<br>(ලබා දෙන උපදෙස් 2ක් තිබිය යුතු ය) | **ලකුණු 02 යි.** |
| 4. | ජනතාවගෙන් අපේක්ෂා කරන සහාය<br>(අපේක්ෂිත සහයෝගය ලැබෙන අවස්ථා 2ක් තිබිය යුතු ය.) | **ලකුණු 02 යි.** |



අ.පො.ස සාමාන්‍ය පෙළ සියලුම විෂයන්ට අදාල ප්‍රශ්න පත්‍ර/පිළිතුරු පත්‍ර/සටහන් ලබා ගැනීමට Past Papers Wiki වෙත පිවිසෙන්න
CamScanner

03. <u>ශිල්පීය දක්ෂතා සඳහා ලකුණු 03 යි.</u>

නිවැරදි අක්ෂර වින්‍යාසය, උක්ත ආඛ්‍යාත පද සම්බන්ධය, පැහැදිලි අත් අකුරු, නිවැරදි පද බෙදීම, වියරණ, විරාම ලක්ෂණ, ඡේද වෙන් කිරීම සමස්තයක් ලෙස සලකා ලකුණු පිරිනමන්න.

- ❖ නියමිත වචන ගණන අඩු වන කල්හි හෝ ප්‍රමාණවත් කරුණු හෝ අදාළ කරුණු අන්තර්ගත නොවන අඩුපාඩු සහිත උත්තර ඇති කල්හි ආනුපාතික ලකුණක් දෙන්න.
- ❖ නියමිත ආකෘතිය අනුගමනය කර නොමැති කල්හි අන්තර්ගතය සඳහා දිය හැකි උපරිමය **ලකුණු** 03කි.

**නැතහොත්**

**දැන්වීම - ලකුණු 15 යි.**

ලකුණු විග්‍රහය - මුළු ලකුණු 15 යි.

| | | |
|---|---|---|
| 01. | ආකෘතිය සඳහා | **ලකුණු 04 යි.** |
| 02. | අන්තර්ගතය සඳහා | **ලකුණු 08 යි.** |
| 03. | ශිල්පීය දක්ෂතා සඳහා | **ලකුණු 03 යි.** |

01. <u>ආකෘතිය ලකුණු 04 යි.</u>

| | | |
|---|---|---|
| 1. | ආකර්ෂණීය මාතෘකාව | **ලකුණු 01 යි.** |
| 2. | පළකරන්නාගේ නම, තනතුර | **ලකුණු 01 යි.** |
| 3. | පළකරන දිනය | **ලකුණු 01 යි.** |
| 4. | නිර්මාණශීලීත්වය | **ලකුණු 01 යි.** |

(අකුරුවල ප්‍රමාණය, අකුරුවල හැඩතල, අකුරු වර්ණ ගැන්වීම)

02. <u>අන්තර්ගතය සඳහා ලකුණු 08 යි.</u>

| | | |
|---|---|---|
| 1. | චිත්‍රවල තේමාව | **ලකුණු 02 යි.** |
| 2. | භාවිත කළ හැකි මාධ්‍ය | **ලකුණු 02 යි.** |
| 3. | චිත්‍රවල ප්‍රමාණය | **ලකුණු 02 යි.** |
| 4. | සංවිධානය හා භාරදිය යුතු දිනය | **ලකුණු 02 යි.** |

03. <u>ශිල්පීය දක්ෂතා ලකුණු 03 යි.</u>

නිවැරදි අක්ෂර වින්‍යාසය, උක්ත ආඛ්‍යාත පද සම්බන්ධය, පැහැදිලි අත් අකුරු, නිවැරදි පද බෙදීම, වියරණ, විරාම ලක්ෂණ, ඡේද වෙන් කිරීම සමස්තයක් ලෙස සලකා ලකුණු පිරිනමන්න.

- ❖ නියමිත වචන ගණන අඩු වන කල්හි හෝ ප්‍රමාණවත් කරුණු හෝ අදාළ කරුණු අන්තර්ගත නොවන අඩුපාඩු සහිත උත්තර ඇති කල්හි ආනුපාතික ලකුණක් දෙන්න.
- ❖ නියමිත ආකෘතිය අනුගමනය කර නොමැති කල්හි අන්තර්ගතය සඳහා දිය හැකි උපරිමය ලකුණු 03කි.



CamScanner

# 21 - සිංහල භාෂාව හා සාහිත්‍යය

## III පත්‍රය

- ❖ උපදෙස් දී ඇති පරිදි ප්‍රශ්න පහකට පමණක් උත්තර සපයන්න.
- ❖ 1, 2, 3, 4 ප්‍රශ්නවලටත් 5, 6, 7 ප්‍රශ්නවලින් එකකටත් උත්තර සපයන්න.

**මෙම ප්‍රශ්න පත්‍රයට නියමිත ලකුණු ගණන 80කි.**

මේ පත්‍රයේ දී නිර්දිෂ්ට සාහිත්‍ය පාඨ පිළිබඳ ව අපේක්ෂකයාගේ අවබෝධය හා රසවින්දන හැකියාව ඇගයීමට භාජන කෙරේ.

**ප්‍රශ්න අංකය 01**

**අපේක්ෂණය** - නිර්දිෂ්ට ග්‍රන්ථ පරිශීලනය පිළිබඳ පරිචය ඇගයීම

ඉගෙනුම් පල -

- ➢ නිර්දිෂ්ට කෘතිවල කතුවරයා සහ කාලය හඳුනා ගෙන ප්‍රකාශ කරයි.
- ➢ නිර්දිෂ්ට ගද්‍ය සහ පද්‍ය නිර්මාණ අවබෝධයෙන් යුතු ව කියවා අර්ථය විවරණය කරයි.
- ➢ නිර්දිෂ්ට නිර්මාණවල අවස්ථා සම්බන්ධය ලියා දක්වයි.
- ➢ පුරාතන සාහිත්‍යය පිළිබඳ අවබෝධය ප්‍රකාශ කරයි.

**ලකුණු විග්‍රහය** - **මුළු ලකුණු 20 යි.**

මෙම ප්‍රශ්නයට කෙටි උත්තර අපේක්ෂිත අනුප්‍රශ්න දහයක් ඇතුළත් වේ. එක් අනුප්‍රශ්නයක එක කොටසකට ලකුණු 01 බැගින් මුළු ලකුණු 20කි.

**1.** (i) සිට (x) තෙක් ඇති **සියලු ම** අනුකොටස්වලට කෙටි උත්තර ලියන්න. **කිසියම් අනුකොටසකට උත්තර නොලියන්නේ නම්, එහි අංකය ලියා ඉදිරියෙන් ඉරක් අඳින්න.**

(i) කඳු බෑවුමක දං - බෝවිටි පඳුරු — ත ළා
පහළට ඇදී පර මල් පෙති ඉවත — නො ළා
**කලලෝ දියෙන් පොගවා රන් පුලින — ත ලා**
සංගීතවත් වී යම් ඉදිරියට — ග ලා

**(අ)** මේ පද්‍යය ඇතුළත් කාව්‍ය නිර්මාණයේ නම ලියන්න.
**(ආ)** තද කළු අකුරින් මුද්‍රිත පද්‍ය පාදයේ අදහස කුමක් ද?

**(අ)** ගංගාවේ සංගීතය
**(ආ)** රන් වැලිතලා රිදීවන් ජලයෙන් පොඟවා

(ii) "නිවෙසේ දී නැවත වරක් තම රූප සෞන්දර්යය ආස්වාදනය කිරීමේ අටියෙන් කැටපත ඉදිරියට ගිය ඈ, තම පොරෝනය ඉවත් කළා ය. එකෙණෙහි ම ඈ මහ හඬක් නැඟුවා ය."

**(අ)** මෙහි සඳහන් තැනැත්තිය මහ හඬක් නැඟීමට හේතුව කුමක් ද?
**(ආ)** මේ උද්ධෘතය ඇතුළත් නිර්මාණයේ කතුවරයා නම් කරන්න.

**(අ)** දියමන්ති මාලය ගෙලෙහි නොමැති වීම
**(ආ)** ගී ද මෝපසාං



CamScanner
අ.පො.ස සාමාන්‍ය පෙළ සියලුම විෂයන්ට අදාල ප්‍රශ්න පත්‍ර/පිළිතුරු පත්‍ර/සටහන් ලබා ගැනීමට Past Papers Wiki වෙත පිවිසෙන්න

(iii) පහත දැක්වෙන කවියේ ඉතිරි පද දෙක සම්පූර්ණ කරන්න.

අග පිපි මල් මලිගිය ලිය කැලේයා
එග බැඳ ගෙන රජ හස පුල් විලේයා

(අ) ..........................................................................

(ආ) ..........................................................................

(අ) ළග තුරු මල් ගිලිහුණු රොනවු' ලේයා

(ආ) මග බැස යව පළ හෙළ වැලි තෙලේයා

(iv) "එසේ හෙයින් කල් නොයවා යහපත් නැකැතෙකින් වහා නික්මුණු මැනැවැ."

(අ) මේ ප්‍රකාශය කළේ කවරෙක් ද?

(ආ) උක්ත ප්‍රකාශයෙන් අනතුරුව ඔවුන් නික්ම ගියේ කුමක් සඳහා ද?

(අ) කේවට්ට බමුණා/ චූලනී බ්‍රහ්මදත්ත රජුගේ අග්‍රපුරෝහිත

(ආ) සේනාව පිරිවරා ගෙන කුඩා නුවරක් වටලා ගැනීමට

(v) "හිර ගෙදරින් අහපුවාම, උඹට දැන ගන්ඩ පුළුවන් වෙයි."

(අ) මේ ප්‍රකාශය කළේ කවරෙක් ද?

(ආ) මෙහි **'දැන ගන්ඩ පුළුවන් වෙයි.'** යනුවෙන් ප්‍රකාශ වන්නේ කුමක් ගැන ද?

(අ) පුංචිරාළ/ වෙදරාළ/ අලුත් ආරච්චි

(ආ) හිර ගෙදර දී බබුන් මිය ගියේ ද, නැතහොත් ජීවත් වන්නේ ද කියා. / බබුන් ගැන තොරතුරක් දැන ගැනීමට

(vi) මිහ'ඹ මුව මඬල මෙන් දිලෙන හැම විට
දුලඹ ඉසුරු පිරි සැදි ඒ වෙහෙර සිට
තිරඹ පොකුරු මී රස ලැබ බොන ලෙසට
නරඹ මිතුර තගෙ නෙත සිත සතුටු කොට

(අ) මෙහි සඳහන් වන වෙහෙර හැඳින්වූයේ කුමන නමකින් ද?

(ආ) **'මිහිකත'** යන්න සඳහා මෙහි යෙදී ඇති වචනය කුමක් ද?

(අ) කැරගල විහාරය/ කැරගල වෙහෙර/ කැරගල පද්මාවති පිරිවෙන් විහාරය

(ආ) මිහ' ඹ

(vii) රන් විමනේ සිටි මුත් දුක නැති වෙද්ද
පැණි මියේ කෑ මුත් බඩ ගිනි නැද්ද
**මිණි බරණින් සැදු මුත් ගත නොදිරද්ද**
පැණිවරකා ගසටත් හෙණ නොවදිද්ද

(අ) තද කළු අකුරින් මුද්‍රිත කොටසේ අර්ථය ලියන්න.

(ආ) යහපත් දෙයකට වුවත් අයහපතක් සිදු විය හැකි බව ඇඟවෙන පද්‍ය පාදය උපුටා දක්වන්න.

(අ) මැණික් ආභරණවලින් සැරසුණු නමුත් ශරීරය දිරන්නේ නැද්ද?

(ආ) පැණි වරකා ගසටත් හෙණ නොවදිද්ද

(viii) "ම දුව විකුණන්නා නැත. රන් හැර ගෙන නො දෙමි. අපටත් රක්ෂාව නම් ඌ ම වේ ද?"

(අ) මේ ප්‍රකාශය කළේ කවරකු ද?

(ආ) මේ ප්‍රකාශය ඇතුළත් කෘතිය අයත් වන්නේ කුමන යුගයකට ද?

(අ) විද්දත් දියණියන්ගේ පියා/ විද්දතාණන්

(ආ) දඹදෙණි යුගය

(ix) "මහත් වූ කෝලාහල ශබ්දයෙක, අපි කුමක් බවත් නො දනුමහ. 'කුමන අරගලයෙක් දැ' යි විමසුව හොත් යහපතැ"

(අ) මේ ප්‍රකාශය කරන ලද්දේ කවුරුන් විසින් ද?

(ආ) මෙහි සඳහන් පරිදි මහත් වූ කෝලාහල ශබ්දයක් ඇති වීමට හේතුව කුමක් ද?

(අ) සේනකාදි පඬිවරුන්/ වේදේහ රජුගේ පඬිවරුන් / පඬිවරු 4 දෙනා./

(ආ) චූලනී බ්‍රහ්මදත්ත රජ ඇතුළු එක් සියයක් රජවරුන් සේනාවත් සමග මියුලු නුවර වටලෑම නිසා – [illegible] මියුලු නුවර වටලෑම/ [illegible] මියුලු නුවර වටලෑම.

(x) (අ) පැරණි ම සිංහල සිවුපද කාව්‍ය ග්‍රන්ථ ලෙස සැලකෙන සන්දේශ කෘති **දෙක** නම් කරන්න.

(ආ) '**පූජාවලිය**' කෘතියේ කතුවරයා කවරෙක් ද?

(අ) මයූර සන්දේශය, තිසර සන්දේශය 1 ක් [illegible] ලකුණු නැත. ½ [illegible]

(ආ) මයූරපාද පරිවේණාධිපති බුද්ධපුත්‍ර හිමි/ බුද්ධ පුත්‍ර හිමි / මයූරපාද පරිවේණාධිපති [illegible]



අ.පො.ස සාමාන්‍ය පෙළ සියලුම විෂයන්ට අදාල ප්‍රශ්න පත්‍ර/පිළිතුරු පත්‍ර/සටහන් ලබා ගැනීමට Past Papers Wiki වෙත පිවිසෙන්න
CamScanner

**ප්‍රශ්න අංකය 02**

**අපේක්ෂණය** - නිර්දිෂ්ට සාහිත්‍ය පාඨ පිළිබඳ විමර්ශනාත්මක අවබෝධය

ඉගෙනුම් පල -

- ➢ නිර්දිෂ්ට ගද්‍ය නිර්මාණ අවබෝධයෙන් යුතු ව කියවා අර්ථය විවරණය කරයි.
- ➢ නිර්දිෂ්ට ගද්‍ය සහ පද්‍ය නිර්මාණ අවබෝධයෙන් යුතු ව කියවා අවස්ථා විස්තර කරයි.

**ලකුණු විග්‍රහය** - **මුළු ලකුණු 20 යි. (එක් කොටසකට ලකුණු 04 බැගිනි.)**

(අ) කොටස **ලකුණු 02 යි.**
(ආ) කොටස **ලකුණු 02 යි.**

**2.** පහත සඳහන් ගද්‍ය හා පද්‍ය පාඨ කියවා අසා ඇති ප්‍රශ්නවලට කෙටි උත්තර ලියන්න.

**(i)** සිදු වූ පුවත අනාවරණය කරන ලෙසා
දෙදෙනා කැඳවා ගෙන කීවා තතු මෙලෙසා

**(අ)** මෙහි සඳහන් දෙදෙනා හැඳින්වූයේ කවර නම්වලින් ද?
**(ආ)** මෙහිදී අනාවරණය කෙරුණු පුවත කෙටියෙන් විස්තර කරන්න.

**(අ)** සිංහබාහු; සිංහසීවලී

**(ආ)** සුප්පා දේවිය වංග දේශයේ රජුගේ දියණියන් බවත්, රජ සැප හැරදා වනයේ දී හමු වූ සිංහරජයෙකු සමග පැමිණි බවත්

**(ii)** "කනක රජතාදීන් විචිත්‍ර වූ රක්ත නීලාදි වූ නානා වස්ත්‍රයෙන් සමුජ්වලිත රථාදියෙහි නගන ලද නා නා ප්‍රකාර **ධවලච්ඡත්‍ර** පංක්තියෙන් ගැවැසී ගත්තී ය. ඇත් වාහන, අස් වාහන රථ වාහනයෙන් යුක්ත ය. හස්ති ශිල්ප යැ, අශ්ව ශිල්ප යැ, රථ ශිල්ප යැ, ධනුශ්ශිල්ප යැ ආදි වූ අටළොස් මහා ශිල්පයෙහි කෙළ පැමිණියන් විසින් විශේෂයෙන් **සමෘද්ධ ය**. මේ සේනා තොමෝ සිංහ සමාන වික්‍රම ඇත්තී ය."

**(අ)** තද කළු අකුරින් මුද්‍රිත පදවල අර්ථ වෙන වෙන ම ලියන්න.
**(ආ)** යුද්ධ සේනාව වර්ණනා කර ඇති ආකාරය කෙටියෙන් විස්තර කරන්න.

**(අ)** ධවලච්ඡත්‍ර - සුදු කොඩි
සමෘද්ධ ය - සමන්විත ය / සඵල ය

**(ආ)** රන් රිදී ආදියෙන් විසිතුරු කරන ලද රතු සහ නිල් පැහැයෙන් නොයෙක් ආකාර වස්ත්‍රවලින් බබළන, රථවල ඔසවන ලද නොයෙක් ආකාර සුදු කොඩි සමූහයෙන් යුක්ත වූ ඇත් අස් රථ වාහන එසේ සරසා තිබුණි. හස්ති ශිල්ප, අශ්ව ශිල්ප, රථ ශිල්ප, දුනු ශිල්ප ආදි 18ක් වූ ශිල්ප හොඳින් ප්‍රගුණ කළ අයගෙන් විශේෂයෙන් ම සමන්විත ය. මේ සේනාව සිංහයකු හා සමාන දක්ෂතාවලින් යුක්ත ය.

(අදහස තමාගේ වචනයෙන් ලියා ඇත ද ලකුණු දෙන්න)

(iii) පිය සන් නො ව බිඳු දැල් රැඳි කොපුලී
අවසන් නො ව වෙණ නදට ම **කුහුලී**
මද සන් සුන් පියොවින් සිටි නොසැලී
ගජ සෙන් සිතියම් ගජ සිරි **කියෙලී**

(අ) තද කළු අකුරින් මුද්‍රිත පදවල අර්ථ වෙන වෙන ම ලියන්න.
(ආ) වීණා නාදයට ලොල් වූ ඇතුන්ගේ හැසිරීම් රටාව කෙටියෙන් විස්තර කරන්න.

(අ) කුහුලී :- කුහුල / කුතුහලය
කියෙලී :- ප්‍රකාශ කළේ ය/ කියා පෑවේ ය

(ආ) මී මැස්සන් ඇතුන්ගේ මද වැගුරුණු කන්වල වසා සිටිය ද වීණා නාදයට ලොල් වූ ඇතුන් මද සන්සිඳුණු ස්වභාවයෙන් නො සැලී සිටියේ සිතියම්වල ඇතුන්ගේ ස්වභාවය පළ කරමිනි.

(iv) නිල තුරඟුට නැඟෙමින් රිවි දෙව් සිරින
**දුල කැරැ** සේසත් මිණි බරණ **කිරණින**
බල පිරි සෙන් සහ යාපා පටුන් ගෙන
බල සේනානායක සපු කුමරු එන

(අ) තද කළු අකුරින් මුද්‍රිත පදවල අර්ථ වෙන වෙන ම ලියන්න.
(ආ) මුළු පද්‍යයේ ම අර්ථය ලිහිල් බසින් ලියන්න.

(අ) දුල කැරැ :- බබළවමින්
කිරණින :- රශ්මියෙන්/ කාන්තියෙන්

(ආ) සූර්ය දිව්‍ය රාජයාගේ ආකාරයෙන් කළු (නිල්) අසුපිට නැගී, මැණික් ආභරණවල කාන්තියෙන් සේසත් බබළවමින්, යාපා පටුන ජය ගෙන බලයෙන් පිරුණු සේනාව සමගින් එන්නා වූ සේනාධිපති සපුමල් කුමාරයා බලන්න.

(v) **"මම යන්නට නො නිස්සෙමි. සතර දෙනකු කෙරෙහි විස්වස් නැතිඃ සොර 'පෙරැ මා සබඳත' යි විස්වස් නොකට යුත්තෙ යැ. තමා පළමු අතොට හුන් කොළ 'මා පෙරැ වළඳ ගත්තෙ යැ' යි විස්වස් නොකට යුත්තෙ යැ. රජ 'මා හා සබඳත' යි විස්වස් නොකට යුත්තෙ යැ. ස්ත්‍රී 'මට වශ්‍ය යැ'යි විස්වස් නො ද කට යුත්තෙ යැ' යි කී යැ."**

(අ) මේ ප්‍රකාශය කවුරුන් විසින් කාහට කරන ලද්දක් ද?
(ආ) මෙහි සඳහන් වන පරිදි විශ්වාස නොකළ යුතු අවස්ථා හතර පැහැදිලි කරන්න.

(අ) භර්ග බමුණා විසින් මන්තාණි බැමිණියට/ අංගුලිමාලගේ පියා විසින් මවට
(ආ) පෙර තමා හා සබඳතා පැවැත්වූවේ යැයි සිතා සොරා ද, තමා පෙර පරිහරණය කළේ යැයි සිතා පළමු අතුරා සිටි කොළ ද, තමා හා සබඳතා පැවැත්වූයේ යැයි රජ ද, තමාට වසඟ වූවා යැ'යි සිතා කාන්තාව ද විශ්වාස නොකළ යුතු ය.



අ.පො.ස සාමාන්‍ය පෙළ සියලුම විෂයන්ට අදාල ප්‍රශ්න පත්‍ර/පිළිතුරු පත්‍ර/සටහන් ලබා ගැනීමට Past Papers Wiki වෙත පිවිසෙන්න
CamScanner

**ප්‍රශ්න අංකය 03**

**ඉගෙනුම් පල -**

- අවස්ථා සිද්ධි හා චරිත නිරූපණය පිළිබඳ ව සැලකිලිමත් වෙමින් උම්මග්ග ජාතකයේ නිර්දිෂ්ට කොටස රස විඳිමින් විචාරය කරයි.
- ගුත්තිල කාව්‍යයේ නිර්දිෂ්ට කවිවල අවස්ථා නිරූපණය සහ විරිත් භාවිතය පිළිබඳ විචාරය කරයි.

3. මියුලු නුවර යටත් කර ගැනීම සඳහා,
   - කේවට්ට බමුණා යෙදූ උපක්‍රමත්
   - මහෞෂධ පඬිතුමා එම උපක්‍රම ව්‍යර්ථ කළ ආකාරයත්

පාඨක සිත්වල වාක් චිත්‍ර මැවෙන ආකාරයෙන් ඉදිරිපත් කිරීමට කතුවරයා සමත් වී ඇති අයුරු 'උම්මග්ග ජාතකයේ' නිර්දිෂ්ට කොටසින් එක් කරුණකට උදාහරණ **දෙක** බැගින් දක්වමින් විමසන්න.

**නැතහොත්**

- ජීවමාන ලෙස අවස්ථා නිරූපණයත්
- අවස්ථෝචිත ලෙස විරිත වෙනස් කිරීමත්

'ගුත්තිල කාව්‍යයේ' සාර්ථකත්වයට හේතු වී ඇත. නිර්දිෂ්ට කොටසින් එක් කරුණකට උදාහරණ **දෙක** බැගින් දක්වමින් විමසන්න.

නිදර්ශන සඳහා ලකුණු 04 යි.
විග්‍රහයට ලකුණු 11 යි.
(ලකුණු 15 යි.)

මියුලු නුවර යටත් කරගැනීම සඳහා කේවට්ට බමුණා යෙදූ උපක්‍රම හා මහෞෂධ පඬිතුමා එම උපක්‍රම ව්‍යර්ථ කළ ආකාරය පාඨක සිත්වල වාක් චිත්‍ර මැවෙන ආකාරයෙන් ඉදිරිපත් කර ඇති බව, සතර කන් මන්ත්‍රණය ගැළපෙන උදාහරණ මගින් විස්තර කර තිබීම අපේක්ෂා කෙරේ.

**මියුලු නුවර යටත් කර ගැනීමට කේවට්ට බමුණා යෙදූ උපායන් :-**

- මියුලු නුවරට පැන් සැපයීම නැවැත්වීම

  උදා:- ''වන්නා ව මහරජ නුවරට පැන් නම් පිටතින් වන්නේ ය. කීප දවසක් පැන් නවතා ලන්නා පැන් නොලදින් ක්ලාන්ත වූවාහු දොර හැර පියන්නාහ."
- මියුලු නුවර ඇතුළට වී සහල් සම්පාදනය නැවැත්වීම

  උදා:- ''නුවරට සහල් නම් පිටතින් ම වන්නේ ය. ඒ වී සහල් වැද්ද නොදෙම්හ. බතින් පීඩිත වූ මනුෂ්‍යයෝ දොර හැර පියන්නාහ."
- දර සැපයීම නැවැත්වීම

  උදා:- ''නුවර ඇතුළේ වලක් නැති හෙයින් දර නම් පිටතින් ගෙන මුත් නොහැක්කේ ය. දර නවතාලා නුවර ඇර ගනුම්හ."

ධර්ම යුද්ධය

''මහරජ, දෙසේනාව සටන් නොකොට මැනව, රජ දරුවන් දෙදෙනාගේ පණ්ඩිත දෙදෙන එක තැනකට එද්ද, ඉන් එක් කෙනෙක් වැන්දවු නම් වැඳි පක්ෂයේ රජ හට පරාජය වන්නේ ය. වැඳුම් ලත් පක්ෂයේ රජහට ජය වන්නේ ය."

**මෙබඳු වෙනත් යෝග්‍ය උදාහරණ මගින් කේවට්ටගේ උපායන් විස්තර කර ඇත්නම් ඒවා ද පිළිගන්න.**



CamScanner

**මහෞෂධ පණ්ඩිතයන් කේවට්ටගේ එම උපක්‍රම ව්‍යර්ථ කළ ආකාරය :-**

- පැන් සැපයීම නැවැත්වීමට ගත් උපක්‍රමය ව්‍යර්ථ කිරීම
  උදා:- ''මේ කේවට්ට මහල්ලා ඇතුළු අඥාන ජඩයෝ මා තව ම මහෞෂධ පණ්ඩිත බව නොදන්නා වන්හ.''
  සැටරියන් උණ දණ්ඩක් ගෙන්වා සරියේ දෙකක් කොට පළා ..........
  ''චර පුරුෂයා මනන්නේ සැටරියන් දණ්ඩ අසූ රියන් කොට මැන පී ය.''
- වී සහල් නැවත්වීමට ගත් උපක්‍රමය ව්‍යර්ථ කිරීම
  උදා:- ''අනුප්‍රාකාර යැයි කියන ලද පදනම් මුඳුනේ කලල් අතුරුවා, ඊ පිට වී ඉස්වා ලූ සේක.''
  ''...ගොවියා පුත් මහෞෂධයා මතු වන්නා වූ භය දැන වලැ දරෙක් තිබී ද? එක හෙළා අද්දා ගෙන'වුත්...''
- දර සැපයීම නැවැත්වීමට ගත් උපක්‍රමය ව්‍යර්ථ කිරීම
  උදා:- ''පිටතට පෙනෙන නියායෙන් දර රැස් කරවා පී සේක.''

ධර්ම යුද්ධය ජය ගැනීම.
''පණ්ඩිතයෙනි, තොපට සුදුසු පඬුරක් සොයන්නෙම් අද මේ මිණි රුවන ලදිමි හැර ගනුව.''
''නැඟී සිටුව! ආචාරීනි, නැඟී සිටුව! ආචාරීනි, මම බාලයෙමි; තොපගේ මුනුබුරු තරමට ඇත්තෙමි. මා නො වඳුව....''

**මෙබඳු ගැළපෙන වෙනත් උදාහරණ යොදා විස්තර කර ඇත්නම් ඒවා ද පිළිගන්න.**

**නැතහොත්,**

ගුත්තිල කාව්‍යයේ සාර්ථකත්වයට ජීවමාන ලෙස අවස්ථා නිරූපණයත් අවස්ථෝචිත ලෙස චරිත වෙනස් කිරීමත් ඉවහල් වූ ආකාරය උදාහරණ මගින් විස්තර කර තිබිය යුතු යි.

- **ජීවමාන ලෙස අවස්ථා නිරූපණය :-**

  නො දැන ම තමා බල
  සබයට අවුත් නො පැකිළ
  වැද රද පද කමල
  දෙසෙක මූසිලයා ද උන් කල

- කැර මිණි බරණ රැස්
  රසින් සුර සැවු සුවහස්
  සුරන් සහ සහසැස්
  නො කැර සිටියේ අහස් කුස හිස්

- නිති නිරිඳුගෙ රැකවලෙහි නියුත්තෝ
  රුති ලෙස රුපුනොද බිඳ ජය ගත්තෝ
  පැති රෙන වෙණ නද බැඳුණු සිතැත්තෝ
  අති නවි ගිලිහෙන බව නොම දත්තෝ



CamScanner
අ.පො.ස සාමාන්‍ය පෙළ සියලුම විෂයන්ට අදාල ප්‍රශ්න පත්‍ර/පිළිතුරු පත්‍ර/සටහන් ලබා ගැනීමට Past Papers Wiki වෙත පිවිසෙන්න

- මන මත් කරවන දන මුළු　　දෙරණා
  රසවත් වන වෙණ නද නද　　කරණා
  සවනොත් සඳ පුරගන ලොබ　　දිවුණා
  නොදනිත් දරුවන් ඇකයෙන්　　වැටුණා

**මෙබඳු වෙනත් යෝග්‍ය උදාහරණ මගින් විස්තර කර ඇත්නම් ඒවා ද පිළිගන්න.**

- **අවස්ථෝචිත ලෙස විරිත් වෙනස් කිරීම :-**

අවස්ථා විස්තර කිරීමේ දී විවිධ විරිත් භාවිත කර තිබීම විශේෂත්වයකි.

1 සිට 13 තෙක් කව්වල කෙටි ගී විරිතක් යොදා ගෙන ඇත.

උදා -

ගුත්තිල ඇදුරු　　සඳ
වීණා වයන ලෙස　　ඉඳ
පසෙක පනවන　　ලද
සුදුසු අස්නෙක ගොසින් උන්　　සඳ

14-32 තෙක් කව්වල එක් පද්‍ය පාදයක මාත්‍රා 16 බැගින් යුත් විරිතක් යොදා ගෙන ඇත.

දිය දිය ගොස පළ කෙරෙමින්　　සපැමිණි
ගිය ගිය තැන ඉස්වා රන් මුතු　　මිණි
ගිය ගිය දිය නද එන මෙන් ගෙන　　මිණි
සිය සිය ගුණයෙන් වෙණ නද　　නික්මිණි

33-34 කව්වල එක් පද්‍ය පාදයක මාත්‍රා විසි හය බැගින් දීර්ඝ විරිතක් භාවිත කොට ඇත.

රූ රැසේ අඳිනා ලෙසේ අත්
　　ලෙළ දිදී විදුලිය පබා
රන් රසේ එක් වන ලෙසේ වෙණ
　　නාදනූ පා තබ තබා
කම්පසේ දෙන සැර ලෙසේ දෙස
　　බල බලා නෙතගින් සබා
මම කෙසේ පවසම් එසේ වර
　　සුර ළඳුන් දුන් රඟ සුබා

**වෙනත් යෝග්‍ය උදාහරණ මගින් විස්තර කර ඇත්නම් ඒවා ද පිළිගන්න**



CamScanner

**ප්‍රශ්න අංකය 04**

**ඉගෙනුම් පල -**

- 'දියමන්ති මාලය' කෙටි කතාව රස විඳිමින් විචාරය කරයි.
- සිංහබාහු නාට්‍යයේ නිර්දිෂ්ට නාට්‍ය පෙළ රස විඳිමින් විචාරය කරයි.

**4.**
- **සිහින ලෝකයක ජීවත් වීමේ ව්‍යාජත්වයත්**
- **සැබෑ ලෝකයේ පවතින යථාර්ථයත්**

**'දියමන්ති මාලය' කෙටිකතාවෙන් මතු කෙරෙන සනාතන පණිවිඩය යි. මැටිල්ඩාගේ චරිතය ඇසුරින් එක් කරුණකට උදාහරණ දෙක බැගින් දක්වමින් විමසන්න.**

**නැතහොත්**

- **උපයුක්ත භාෂාවේ සුමට බවත්**
- **අවස්ථා පෙළ ගැස්වීමේ නිපුණත්වයත්**

**හේතුවෙන් පාඨක සිත් අමන්දානන්දයට පත් කිරීමට 'සිංහබාහු' නාට්‍යය සමත් ව ඇති අයුරු නාට්‍ය පෙළ ඇසුරින් එක් කරුණකට උදාහරණ දෙක බැගින් දක්වමින් විමසන්න.**

නිදර්ශන සඳහා ලකුණු 04 යි.
විග්‍රහයට ලකුණු 11 යි. (ලකුණු 15 යි.)

සිහින ලෝකයක ජීවත් වීමේ ව්‍යාජත්වයත්, සැබෑ ලෝකයේ පවතින යථාර්ථයත් මැටිල්ඩාගේ චරිතය ඇසුරෙන් උදාහරණ සහිත ව විස්තර කර තිබිය යුතු ය.

- **සිහින ලෝකයක ජීවත් වීමේ ව්‍යාජත්වය**
  - ''පෙර දිග මහාර්ඝ තිරරෙදිවලින් අලංකාර කරන ලද, උස් ලෝකඩ පහන් රුක්වලින් ඒකාලෝක කරන ලද...
    සරුවාල ඇඳගත් දැවැන්ත සේවකයන් දෙදෙනෙකුත් විසින් ආවතේව කරනු ලබන...''
  - ''ප්‍රණීත ආහාර පාන ගැන ය; ආශ්චර්යවත් තැටිවල බහන ලද රස මසවුළු ගැන ය;...''
  - තමාගේ විවාහය තමාට නොගැළපෙන පහත් විවාහයක් සේ සලකා අසන්තෝෂයෙන් ජීවත් වීම
  - තමා ඉපදී ඇත්තේ සියලු සැප සම්පත් හා සුඛ විහරණ ආස්වාදනය කිරීමට ය යන හැඟීම නිසා ඇය නිරන්තරයෙන් දුක් වේදනාවලට භාජනය වූවා ය.

- **සැබෑ ලෝකයේ පවතින යථාර්ථය**
  - ''ඇයගේ කුඩා නිවසේ වැඩපළ කර දීමට පැමිණි මෙහෙකාර දැරිය දැකීමෙන් ඇගේ සිත දොම්නස් සහගත කටුක සිතිවිලි රාශියකින් පිරී ඉතිරී ගියේ ය.''
  - ''නිවසේ දිළිඳු අසරණකමින් එහි බිත්තිවල කාලකණ්ණි දුක් බර පෙනුමෙන් දිරා ගිය පුටුවලින් හා අවලස්සන දොර ජනෙල් රෙදිවලින් බලවත් සේ සිත් තැවුලට පත් ඈ...''
  - ''ඇයට ඇඳුම් පැලඳුම් හෝ මුතු මැණික් හෝ කිසිවක් නොතිබුණේ ය.'' එම නිසා උත්සවයට සහභාගි වීම සඳහා ඇයගේ හිතවතියගෙන් මාලයක් ඉල්ලා ගැනීමට සිදු වීම.
  - ''මෙ වන විට ලොයිසල් මහත්මිය මහලු පෙනුමකින් යුතු ව සිටියා ය. ඈ දිළිඳු ගෙවල වසන අනෙක් ස්ත්‍රීන් මෙන් හැඩි දැඩි, ශක්තිමත්, ගොරෝසු, දරදඬු ස්ත්‍රියක බවට පත් ව සිටියා ය. අවුල්ව ගිය කිලිටි කෙසින් ද විසිරී ගිය අවිනීත ඇඳුම් පැලඳුමින් ද, රතු ව රළු වූ දෑත්වලින් ද යුතු වූ ඈ මහ හඬින් කෑ ගසමින් කථා කළා ය.''

**මෙබඳු වෙනත් යෝග්‍ය උදාහරණ මඟින් විස්තර කර ඇත්නම් ඒවා ද පිළිගන්න.**



අ.පො.ස සාමාන්‍ය පෙළ සියලුම විෂයන්ට අදාල ප්‍රශ්න පත්‍ර/පිළිතුරු පත්‍ර/සටහන් ලබා ගැනීමට Past Papers Wiki වෙත පිවිසෙන්න
CamScanner

**නැතහොත්,**

- **උපයුක්ත භාෂාවේ සුමට බව**

1. සරල ව්‍යවහාරික බස් වහරක් යොදා ගැනීම.

   * කිම් ද මැණියනි ඔබ මේ
   පවසන වදනා

   * අප නැතිව පියා ඔබ
   ළය පැළී මැරී යයි

   * ඇයි සුදු දුවණිය
   නුඹවත් නොසිටියෙ

2. ගීතවත් භාෂා භාවිතය

   * අසිරිමත් වූ දේකි මෙලොව
   ප්‍රේමය නමිනා
   වැනූ පොරණ කිවිඳුන් සොඳ
   රස මුසු බසිනා

   * ප්‍රේමවන්ත දරුවෙනි මා
   හිඳිනු කන් යොමා

3. අපූරු පද ගැළපීම (පද සංඝටනය)

   * තුමුල ගතින් දා
   බාහු බෙලෙන් දා
   වෙමි සේ තිදසින් දා

4. කාව්‍යාලංකාර භාවිතය
   (අනුප්‍රාස, උපමා යනාදිය)

   * තර කර ගලිනා ඇති දොර තදිනා
   ඉවත දමා වෙරෙනා
   මහ හෙණ හඬිනා පහරා සැණිනා
   පෙරළමි බාහුවෙනා

   * ගල් ලෙන බිඳලා
   ලෙන්දොර හැරලා
   සිංහබා සිංහබා සිංහබා

   * මම දැන ගතිමි
   මම සැක කළෙමි
   සිංහබා සිංහබා සිංහබා

   * සව් සැප දෙන සිතුමිණ වන්
   ප්‍රේමය සන්දා

5. අපූර්වත්යෙන් යුතු සංවාද භාවිතය

   * මා ප්‍රිය පුතණුවනි හා දුවණියනි, මා වෙත එනු මැන

   * අප කැඳවූයේ කිම ද කියා දැනගනු කැමැත්තෙමු, මැණියනි

   * කිම් ද මැණියනි ඔබ මේ පවසන වදනා



CamScanner

- අවස්ථා පෙළගැස්වීමේ නිපුණත්වය

1. සිංහබාහු කුතුහලයට පත්වන අවස්ථාව

    * පියතුමගේ ගත නැරඹූ කල සිත
    කුහුලින් ඉතිරෙන්නේ
    නැත සම වන්නේ වෙනස පෙනෙන්නේ
    විලස පියාණන්නේ
    කෙලෙස ද ඔහු හට අප දා වූයේ
    ඇයි මව නො කියන්නේ

2. සුප්පාදේවිය දරුවන්ට සත්‍ය ප්‍රකාශ කරන අවස්ථාව

    * මැණිය නුඹ දෙදෙනගෙ වේ
    කුමරියක් මනා
    පසිඳු මහඟු වංග දේසෙ
    නරවර හට දා

3. සිංහබාහු තම උරුමය සොයා යාමට සූදානම් වන අවස්ථාව

    * යන්ට දැන් නම් කාලෙ වේ
    මැණියන් හා නැගණි සමගින්
    උරුමෙ අපගේ සොයමිනා
    වංග දේසේ වෙසෙන ජනතා
    කෙරෙහි වේ මා යුතුකමා

4. සුප්පාදේවියට තම ස්වාමියා හැර යාමට සිදුවීම පිළිබඳ ඇති වන සිත් වේදනාව

    * ඔබ පියා හැර දමා
    යා හැකි ද මේ ලෙනෙන්?
    යන්නට වේ දැන් සැමියා හැරා
    වනවාසෙන් මේ පුතු සමගා
    දරුවන් දෙදෙනා
    හට සෙත් ලැබෙනා
    මග ඔස්සේ යා යුතු වන්නේ...

5. සිංහයා වැලපෙන අවස්ථාව

    * ලෙන තුළ නො වෙති
    පෙරළා නො එති
    * සුරතල් දියණිය
    මොලකැටි වදනින්
    මා සනසන්නිය

**මෙවැනි යෝග්‍ය උදාහරණ දක්වමින් ලියා තිබීම ප්‍රමාණවත් ය**



අ.පො.ස සාමාන්‍ය පෙළ සියලුම විෂයන්ට අදාල ප්‍රශ්න පත්‍ර/පිළිතුරු පත්‍ර/සටහන් ලබා ගැනීමට Past Papers Wiki වෙත පිවිසෙන්න
CamScanner

- **5, 6, 7 ප්‍රශ්නවලින් එකකට පමණක් උත්තර ලියන්න.**

**ප්‍රශ්න අංකය 05**

**ඉගෙනුම් පල -**

➢ චරිත නිරූපණය පිළිබඳ ව සැලකිලිමත් වෙමින් 'අපට වැසිකිළියක්' කෙටි කතාව රස විඳිමින් විචාරය කරයි.

**5. නූගත් ගැමි ජනයා සෞඛ්‍ය පුරුදු කෙරෙහි නැඹුරු කරවීමට වගකිවයුතු නිලධාරීන් ගන්නා වූ වෙහෙස 'අපට වැසිකිළියක්' කෙටිකතාවෙන් පැහැදිලි වෙයි. මහජන සෞඛ්‍ය පරීක්ෂකගේ චරිතය ඇසුරින් උදාහරණ තුනක් වත් දක්වමින් පැහැදිලි කරන්න.**

නිදසුන් සඳහා ලකුණු 03 යි.
විග්‍රහයට ලකුණු 07 යි. } (ලකුණු 10 යි.)

- නූගත් ගැමි ජනයා සෞඛ්‍ය පුරුදු කෙරෙහි නැඹුරු කරවීමට වගකිව යුතු නිලධාරීන් ගන්නා වූ වෙහෙස.

- නූගත් ජනයා සෞඛ්‍ය පුරුදු කෙරෙහි උපදේශාත්මක ව නැඹුරු කිරීමට වඩා, උපක්‍රමශීලී ව යොමු කිරීමට මහජන සෞඛ්‍ය පරීක්ෂකවරයා වෙහෙසෙන ආකාරය උදාහරණ සහිත ව පැහැදිලි කිරීම පිළිතුරෙන් අපේක්ෂා කෙරේ.

- ගම පුරා ඇවිදිමින් ගැමියන්ගේ තොරතුරු රැස් කිරීම.
  ''කවුද මේ ගෙදර ගෘහ මූලිකයා?''
  ''මේ ගෙදර වැසිකිළියක් තියෙනවා ද?''
  නූගත් ගැමියන්ට මෙම භාෂා ව්‍යවහාරය තේරුම් ගත නොහැකි බැවින් ඔවුන්ට ගැළපෙන ලෙස භාෂාව වෙනස් කිරීම.
  ''කවුද මේ ගෙදර ලොක්කා?''
  ''මේ ගෙදර කක්කුස්සියක් තියෙනව ද?''

- ගමේ සෑම නිවසකට ම වැසිකිළියක් ඉදිකරවීමට උපක්‍රමශීලී ව කටයුතු කිරීම.
  ''සුමාන දෙකක් ඇතුළත වැසිකිළියක් හදන්න ඕනැ. මම ආයිමත් සුමාන දෙකකට පස්සේ එනව.''

- නූගත් ගැමියා වැසිකිළි ඉදිකිරීම අතපසු කරන විට අඛණ්ඩ නිරීක්ෂණයක යෙදෙමින් කෙසේ හෝ වැසිකිළි ඉදි කරවීමට පෙලඹවීම් සඳහා ගන්නා උත්සාහය.
  ''මාස දෙකකට පමණ පසු ගමේ නාගරික කෙළවරේ සිට කුණු ඉස්පැට්ටර යළිත් හොල්මන් කරන බව කල්තියා ම දැනගන්නට ලැබිණ''

- නූගත් ගැමියා නීතිමය ක්‍රියාමාර්ගවලට දක්වන බිය වැසිකිළිය ඉදිකිරීමේ කාර්යය සඳහා උපක්‍රමශීලී ව යොදා ගැනීම.
  ''කෝ, වැසිකිළිය හැදුව ද?''
  ''තවම ඉවර නෑ''
  ''ලැල්ල දැම්මට වැසිකිළියක් හැදෙනවද?, මිනිහො.''
  ''ඔවා ගිහින් කියනවා මට නෙවෙයි. උසාවියට.''
  ''වැසිකිළි තැනීමට උනන්දුවක් නොගත් කිහිප දෙනෙකුට නඩු පැවරවීමට ලියා ගෙන ගිය බව සැලවූයෙන් පසුවදා ම වළක් කැපීම ආරම්භ කරන ලදී.''

- ආරම්භයේ සිට වැසිකිළි ඉදි කරන තෙක් මෙන් ම, ඉදිකිරීමෙන් පසු ද තම නිරීක්ෂණ කාර්යය මැනවින් ඉටු කිරීම.
  ''සෞඛ්‍ය පරීක්ෂකවරයා ඊළඟ වාරයේ පැමිණි විට... ඔහු වැසිකිළිය වටේ යමින් පරීක්ෂා කර බැලී ය; දොරෙන් ඇතුළු වී වළට එබිකම් කර බැලී ය.''

- ගැමියන්ට විටින් විට කල් ලබා දෙමින් තමාට පැවරුණු රාජකාරි නිසි පරිදි ඉටු කිරීමට වෙහෙසුණේ ගැමියන්ගේ යහපත් සෞඛ්‍ය පුරුදු ඇති කිරීමේ අරමුණෙනි.



CamScanner

**ප්‍රශ්න අංකය 06**

**ඉගෙනුම් පල -**

➢ 'දරු නැළවිල්ල හෙවත් ජාතික තොටිල්ල' පද්‍ය නිර්මාණය රස විඳිමින් විචාරය කරයි.

**6. 'දරු නැළවිල්ල හෙවත් ජාතික තොටිල්ල' පද්‍ය නිර්මාණය පුද්ගල චරිත සංවර්ධනයට පිටුබලයක් ලබා දෙන පද්‍යවලින් පෝෂිත ය. නිර්දිෂ්ට පද්‍ය ඇසුරින් උදාහරණ තුනක් වත් දක්වමින් විමසන්න.**

**නිදසුන් සඳහා ලකුණු 03 යි.**
**විග්‍රහයට ලකුණු 07 යි.** } **(ලකුණු 10 යි.)**

දරු නැළවිල්ල හෙවත් ජාතික තොටිල්ල පද්‍ය නිර්මාණය පුද්ගල චරිත සංවර්ධනයට පිටුබලයක් ලබා දෙන බව උදාහරණ මගින් විස්තර විය යුතු ය.

- කරදර, බාධක හමුවේ නොසැලී සිටීම

  කරදර දහසක් හමු වී
  ඉන්ටැකි නම් සිනා වෙවී
  ඔහු මෙලොවට පහළ දෙවී
  රජෙකැයි සලකනු මැනවී

- යුතුකම් ඉටු කර ගැරහුම් ලැබුණ ද ඉවසා සිටීමට යොමු වීම

  ඉටු කොට කළ යුතු යුතුකම්
  ලැබුණත් ලෝකෙන් ගැරහුම්
  ඉවසන්නට පුළුවන් නම්
  උඹයි මගේ පුතා උතුම්

- නැති බැරිකම්, අගහිඟ හමුවේ ඒවා මැඩ ගෙන කටයුතු කිරීම

  කාටත් හිමි පොදු දේ නම්
  නැති-බැරි, හිඟ අවහිරකම්
  මේ දේ මැඩ ගෙන දස්කම්
  පෑම තමයි සුරු විරුකම

- තරා තිරම නොබලා යහපත් මිතුරන් හඳුනා ගැනීම

  මිතුරුකමින් පෙරට එතොත්
  දූවිල්ලක් එක්ක වුණත්
  මිතුරු වෙයන් පුතේ උඹත්
  එයයි ලොවේ ගුණය මහත්

**යෝග්‍ය වෙනත් උදාහරණ දක්වමින් විස්තර කර ඇත්නම් ඒවා ද පිළිගන්න.**



අ.පො.ස සාමාන්‍ය පෙළ සියලුම විෂයන්ට අදාල ප්‍රශ්න පත්‍ර/පිළිතුරු පත්‍ර/සටහන් ලබා ගැනීමට Past Papers Wiki වෙත පිවිසෙන්න
CamScanner

Past Papers Wiki



**ප්‍රශ්න අංකය 07**

**ඉගෙනුම් පල -**

➢ අවස්ථා සිද්ධි හා චරිත නිරූපණය පිළිබඳ ව සැලකිලිමත් වෙමින් සද්ධර්මරත්නාවලියේ නිර්දිෂ්ට කොටස රස විඳිමින් විචාරය කරයි.

**7. 'භද්‍ර යෞවන වියේදී විවාහය සම්බන්ධයෙන් උග්ගසේනයන් ගත් වැරදි තීරණය ඔහුගේ අනාගතය නව සන්ධිස්ථානයක් කරා ගෙන යාමට හේතු විය.' නිර්දිෂ්ට කථා වස්තුවෙන් උදාහරණ තුනක් වත් දක්වමින් විමසන්න.**

**නිදසුන් සඳහා ලකුණු 03 යි.**
**විග්‍රහයට ලකුණු 07 යි.** (ලකුණු 10 යි.)

භද්‍ර යෞවන වියේ දී උග්ගසේනයන් ගත් වැරදි තීරණය ඔහුගේ අනාගතය නව සන්ධිස්ථානයක් කරා ගෙන යාමට හේතු වූ ආකාරය පහත උදාහරණ මගින් විමසීමට ලක් කර තිබීම අවශ්‍ය ය.

- උග්ගසේන සිටුපුත් භද්‍ර යෞවන වියේ දී ගත් පළමු වැරදි තීරණය නම් ඔහුගේ විවාහය සඳහා විද්දත් දුව තෝරා ගැනීම ය.

  'ලදොත් ජීවත් වෙමි. නො ලදොත් මියෙමි'

- සිටු පුත්‍රයෙකු වූ උග්ගසේනට විවාහයෙන් පසු සිටු කුලයට නොගැළපෙන කාර්යයන් කිරීමට සිදුවීම එම කාර්යයන් නිසා ම බිරිඳගේ උපහාසයට ලක් වීම. දරුවා නළවන අවස්ථාවේ දී ඇය මෙසේ පවසයි.

  ''ගැල් රකිනවුගේ පුත'' ''බර උසුලන්නවුගේ පුත'', ''කුමකුත් නො දන්නවුගේ පුතැ''

- තම බිරිඳ මෙසේ තමා අපහාසයට ලක් කිරීමට හේතුව ඇගේ අභිමානය බවත් එයට හේතුව ඇය උගත් ශිල්පය බවත් අවබෝධ කර ගත් උග්ගසේන ඇය උගත් ශිල්පය ම පරතෙරට උගනියි.

  ''හුණදඬු අගින් අහසට නැඟී ලා තුදුස් විටක් විචර අහස සිසැරී - පියා බැස ලා හුණදඬු අග සිටියහ.''

- උග්ගසේනයන්ට බුදුරජාණන් වහන්සේ මුණගැසෙනුයේ තමා උපන් නුවර ම තමා උගත් ශිල්ප දැක්වීමට ගත් තීරණයේ අතුරු ප්‍රතිඵලයක් ලෙස ය. බුදුන්වහන්සේගේ ධර්මය ශ්‍රවණය කිරීමට ලැබීම හේතුවෙන් ඔහුගේ ජීවිතය නව සන්ධිස්ථානයක් කරා යොමු විය.

  ''උග්ගසේන සිටුපුත්‍රයාණෝ ද කර'ග රහත් වන්නා සේ නො වන බව මුත් හුණදඬු අග දී පිළිසිඹියා පත් රහත් ව හුණදණ්ඩෙන් බැස-පියා බුදුන් ළගට ගොසින් පසඟ පිහිටුවා වැඳ ගෙන මහණ කරන්ට ආරාධනා කළහ.''

**යෝග්‍ය වෙනත් උදාහරණ දක්වමින් විස්තර කර ඇත්නම් ඒවා ද පිළිගන්න.**

***



CamScanner